රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ඉංජිනේරු සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව

பொறியியல் சேவைப் பிரிவு
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை

Engineering Services Division
Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2674327, 011-2694035, 011-2698268
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2698268
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: esbpubad@gmail.com, d-engs@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: MPA/ESD/02/01/21/2026
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.08.03

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත නිලධාරීන් බඳවා ගැනීම - 2024 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම - සිවිල් කාණ්ඩය (2 වන අදියර )**

2025.05.28 දිනැතිව විවෘත පදනමින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පළ කරන ලද නිවේදනයට වැඩිමනත් වශයෙනි.

02. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2025.03.15 දින පැවති ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉහත නිවේදනයෙන් ප්‍රකාශිත අයදුම්කරුවන්ට අමතරව සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනය සහ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛනයන්හි තොරතුරු පහත පළකර ඇත.

03. එම ලේඛනයේ නම් සඳහන් අයදුම්කරුවන් 2026.08.16 දින නියමිත වේලාවන්හි දී සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අදාළ ලිපි ලේඛන ද සමඟින් එදිනට සහභාගී වන්නේ නම් මැනවි.

04. තවද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි විද්‍යුත් තැපෑලෙන් අදාළ අයදුම්කරුවන් වෙත යොමු කර ඇති බවද කාරුණිකව දන්වමි.

ඉංජි. පී.ඒ.ටී.එන්.පොන්නම්පෙරුම
ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ

අත්/කළේ: එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය

දුරකථන / ෆැක්ස් : 0112 698268
විද්‍යුත් තැපැල් ලිපිනය : d-engs@pubad.gov.lk

## List of Selected Candidates for the Interview

| Cat No | Name with initials | NIC Number | Date | Time |
|---|---|---|---|---|
| C-II-01 | Mr.M.H.M.A Prabaswara | 940580030V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-02 | Miss.W.P.P.M Padmasiri | 199675900207 | 16.08.2026 | 8.30 a.m. |
| C-II-03 | Mrs.D.W.V.M Perera | 956770270V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-04 | Mr.N.T.B Kothalawala | 199934210398 | 16.08.2026 | 8.30 a.m. |
| C-II-05 | Miss.N.M.R.S.N Nawarathna | 927791625V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-06 | Mr.A.H.T.A.S Hewage | 199710000880 | 16.08.2026 | 8.30 a.m. |
| C-II-07 | Miss.K Nirmali | 968330500v | 16.08.2026 | 8.30 a.m. |
| C-II-08 | Mrs.R.M.I.M Ranasinghe | 946382043V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-09 | Mr.K.M. Gunasekara | 973160524V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-10 | Mrs.L.A.R.L Weerarathna | 947252925v | 16.08.2026 | 8.30 a.m. |
| C-II-11 | Mr.K.G.C. Punsara | 950641266V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-12 | Mr.W.D.C.L Abeywickrema | 902243682V | 16.08.2026 | 8.30 a.m. |
| C-II-13 | Mrs.S.A.M.A.B.A. Senanayaka | 845022453v | 16.08.2026 | 9.30 a.m. |
| C-II-14 | Mr.R.D.J.P. Sanjeewa | 951262390V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-15 | Mr.H.J.S. Hasaranga | 983622208V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-16 | Miss.R. G. T. A. Rajapaksha | 965970100V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-17 | Miss.H.H. Senanayake | 956281180V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-18 | Mr.H.M.T.D. Herath | 922473447V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-19 | Mr.H.R Vishvanath | 973010115V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-20 | Mr.B.G.P. Shalika | 962631096V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-21 | Miss.P.S.R. Liyanage | 199062801481 | 16.08.2026 | 9.30 a.m. |
| C-II-22 | Miss.W.P.C.D. Weerasinghe | 938310068V | 16.08.2026 | 9.30 a.m. |


© 2026 Engineering Service Division

| | | | | |
|---|---|---|---|---|
| C-II-23 | Mr.R.N.K Kudagama | 941060056v | 16.08.2026 | 9.30 a.m. |
| C-II-24 | Mr.B.A.G.T.S Wimalasena | 961160553V | 16.08.2026 | 9.30 a.m. |
| C-II-25 | Mrs.L.G.C Lakmali | 908622804v | 16.08.2026 | 10.30 a.m. |
| C-II-26 | Mr.P.L.K Silva | 953593661v | 16.08.2026 | 10.30 a.m. |
| C-II-27 | Miss.P.D.W.C.M Wakista | 978390951V | 16.08.2026 | 10.30 a.m. |
| C-II-28 | Mrs.D.T.H.K Karunarathne | 958580150V | 16.08.2026 | 10.30 a.m. |
| C-II-29 | Mr.W.M.P Madushanka | 199111100830 | 16.08.2026 | 10.30 a.m. |
| C-II-30 | Mr.M.D.P.G.A.I Nandasena | 950120398v | 16.08.2026 | 10.30 a.m. |
| C-II-31 | Mr.Y.R.D.M Illangarathne | 942874324v | 16.08.2026 | 10.30 a.m. |
| C-II-32 | Mr.T.V.T Fernando | 972930679v | 16.08.2026 | 10.30 a.m. |
| C-II-33 | Mr.G.G.U.P Karunarathna | 199603600842 | 16.08.2026 | 10.30 a.m. |
| C-II-34 | Mrs.Y.H.I.B Yapa | 935770300V | 16.08.2026 | 10.30 a.m. |
| C-II-35 | Mr.B.G.M Chathuranga | 983270620v | 16.08.2026 | 10.30 a.m. |
| C-II-36 | Mr.P.M.N.P Wimalasiri | 930880523V | 16.08.2026 | 10.30 a.m. |
| C-II-37 | Mrs.D.P.I Sachinika | 978413773V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-38 | Miss.S.A.A.N Abeywickrama | 986692045v | 16.08.2026 | 11.30 a.m. |
| C-II-39 | Mr.P.C.L Senadheera | 961631726V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-40 | Mr.R.W.D.K Bandara | 952302850V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-41 | Miss.A.G.T.E.M Samarakoon | 996262464V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-42 | Mrs.M.A.L.K Kumari | 967472808V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-43 | Mr.P.M.G.D.K.J Pussella | 980841278V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-44 | Mr.W.P.M Kumara | 920412351v | 16.08.2026 | 11.30 a.m. |
| C-II-45 | Miss.E.M.C.S Ekanayake | 996661245V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-46 | Mr.S. G. H. N Subhawickrama | 920641539V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-47 | Mr.B Ahilakumar | 901361002V | 16.08.2026 | 11.30 a.m. |


© 2026 Engineering Service Division

| | | | | |
|---|---|---|---|---|
| C-II-48 | Mr.R Sivapatham | 962873359V | 16.08.2026 | 11.30 a.m. |
| C-II-49 | Mr.H.L.S Sathik | 199400103909 | 16.08.2026 | 12.30 p.m. |
| C-II-50 | Mr.C Sathursan | 961591074V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-51 | Miss.M Ilangovan | 199755200366 | 16.08.2026 | 12.30 p.m. |
| C-II-52 | Mr.S Sobithan | 199707201045 | 16.08.2026 | 12.30 p.m. |
| C-II-53 | Mr.K Rakulan | 932623781V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-54 | Mr.G Thanushan | 933424197v | 16.08.2026 | 12.30 p.m. |
| C-II-55 | Mr.R.M Jazeem | 971452129V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-56 | Mr.S Thushanth | 962713599V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-57 | Mr.N Srikumaran | 199323700913 | 16.08.2026 | 12.30 p.m. |
| C-II-58 | Mr.A Jenukananth | 932942038V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-59 | Mr.S.M.C Premasiri | 962360939v | 16.08.2026 | 12.30 p.m. |
| C-II-60 | Mr.M Sajeevan | 973630571V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-61 | Mrs.M.A.G.I Sumanasekara | 936392997V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-62 | Mr.L.C Jayasanka | 971912162V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-63 | Mr.G.K Nawarathna | 962901247V | 16.08.2026 | 12.30 p.m. |
| C-II-64 | Mr.N.G.T.M Sandamal | 990772967V | 16.08.2026 | 12.30 p.m. |


© 2026 Engineering Service Division

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

ඉංජිනේරු සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව

பொறியியல் சேவைப் பிரிவு
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை

**Engineering Services Division**
Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2674327, 011-2694035, 011-2698268
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2698268
ඊ-මේල් / மின்னஞ்ச / E-mail: esbpubad@gmail.com, d-engs@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.pubad.gov.lk


මගේ අංකය / எனது இல / My No: MPA/ESD/02/01/21/2026
ඔබේ අංකය / உமதுஇல / Your No:
දිනය / திகதி / Date: 2026.08.03

**(ලියාපදිංචි තැපෑලෙනි)**

<Cat_No>

අයදුම්කරුගේ නම :

ලිපිනය :

ජා.හැ.අංකය :

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

**<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - විවෘත 2024</u>**
**<u>සිවිල් කාණ්ඩය 2 වන අදියර</u>**

දිවයින පුරා පිහිටි රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරු කාණ්ඩයේ තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2026.08.16 දින, …………..ට කොළඹ 07, නිදහස් චතුරශ්‍රය, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් එදිනට සහභාගී වන මෙන් කාරුණිකව දන්වමි.

02. තවද, සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේදී පහත සඳහන් ලිපි ලේඛන ද ඇතුළුව අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව හා එහි සංශෝධනයන් පරිදි අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන ලද සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු පහත සඳහන් **<u>සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් රැගෙන ඒම අනිවාර්ය බව</u>** වැඩිදුරටත් දන්වමි.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය

II. විද්‍යාවේදී ඉංජිනේරු උපාධි සහතිකය හෝ එම උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන හා අනෙකුත් සියලුම අවශ්‍යතා බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකය

III. ඉහත සහතික පත්‍ර නිකුත් කිරීමට පාදක කරගනු ලබන සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය (Academic Transcript)

IV. අධ්‍යයන පොදු සහතික පත්‍ර සා.පෙළ විභාගයේ ප්‍රතිඵල ලේඛනය

V. උප්පැන්න සහතිකය

VI. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය

SPECIMEN

VII. ඉහත V, VI හි සඳහන් ලිපි ලේඛනයන්හි **<u>ඔබ විසින්ම සහතික කරන ලද ඡායාස්ථ පිටපත් කට්ටලයක්</u>** සහ ඉහත II, III සහ IV හි සඳහන් ලිපි ලේඛනයන්හි **<u>ඔබ විසින්ම සහතික කරන ලද ඡායාස්ථ පිටපත් කට්ටල දෙකක් (02)</u>**

**<u>(සියලු ඡායා පිටපත් ලබා ගැනීම සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි පමණක් භාවිත කළ යුතුය)</u>**

VIII. අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 7.2.3.1 වගන්තියේ සඳහන් පරිදි ඔබ ලබා ඇති විද්‍යාවේදී ඉංජිනේරු උපාධි සහතිකය හෝ එම උපාධියට සමාන සුදුසුකමක් හෝ ලබා ඇත්තේ **<u>ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් නොවන්නේ නම්</u>** ඔබ එම හදාරන ලද පාඨමාලාව, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පාඨමාලාවක් බවට එම කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිපිය

IX. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ වරලත් සාමාජිකත්වය ලබා ඇති බවට සහ එම සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යන බවට තහවුරු කිරීමට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නිකුත් කරනු ලබන ලිපිය (2025 සහ 2026 වර්ෂවල සාමාජිකත්වය තහවුරු කිරීම සඳහා)

X. 2017 අංක 04 දරන පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ, අදාළ සේවා කාණ්ඩය යටතේ ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු හෝ වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම සහ 2025, 2026 වර්ෂ සඳහා වලංගු සාමාජිකත්වය තහවුරු කිරීම සඳහා ලේඛන

XI. ග්‍රාම නිලධාරී විසින් ඩී.එස් 04 ආකෘති පත්‍රයෙන් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය

XII. ඔබ භාවිතා කරන නමේ හා උප්පැන්න සහතිකයේ / ජාතික හැඳුනුම්පතෙහි සහ අනෙකුත් සහතික පත් වල සඳහන් වන නමේ සුළු හෝ වෙනසක් ඇත්නම්, එම වෙනස පැහැදිලි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් දිවුරුම් ප්‍රකාශයක්. (අදාළ සහතික වල නම් වෙන වෙනම සඳහන් කරමින් එම නම් වලින් හඳුන්වනු ලබන්නේ එකම පුද්ගලයකු බවට ප්‍රකාශ කර රු.50/-ක අවලංගු නොකරන ලද මුද්දරයක් මත ඔබගේ අත්සන තබා සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් එය සහතික කළ යුතුය.)

03. **<u>ඔබ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නම්</u>** ඉහත සඳහන් ලිපි ලේඛනවලට අමතරව පහත සඳහන් **<u>සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ඡායාස්ථ පිටපත් කට්ටලයක් රැගෙන ඒම අනිවාර්ය බව</u>** වැඩිදුරටත් දන්වමි.

I. රාජ්‍ය සේවයට හෝ පළාත් රාජ්‍ය සේවයට පත්වීමේ / අන්තර්ග්‍රහණය කළ ලිපිය

II. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය

III. පූර්වාසන්න වසර පහක් තුළ විනය ක්‍රියාමාර්ගයන්ට භාජනය නොවූ බව හා ඉදිරියේදී විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කර නොමැති බව සහතික කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන ලිපිය **<u>( ආයතන ප්‍රධානියා විසින් නිකුත් කල මුල් පිටපත රැගෙන ඒම අනිවාර්ය වේ.)</u>**

IV. 2020 සිට 2026 වර්ෂය දක්වා අදාළ වැටුප් වර්ධක සහතික පත්‍ර සහ කාර්ය සාධන වාර්තා **<u>(ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ඡායාස්ථ පිටපත් කට්ටලයක් පමණක් ප්‍රමාණවත් වේ.)</u>**

SPECIMEN

04. උක්ත සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් පමණක්ම වන අතර එහිදී ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

05. එසේ අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණය පිරවීමේදී මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් විසින් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරනු ලබන අතර එහිදී ගනු ලබන අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. පත්වීම් ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. අපේක්ෂකයන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කරනු ඇත.

07. මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම සඳහා ගමන් වියදම් හෝ කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

08. නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවැනි ඉල්ලීම් සලකා නොබලන බවද, අදාළ සියලු ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේදී **අනිවාර්යෙන්ම** ඉදිරිපත් කළ යුතු බවද කාරුණිකව දන්වමි.

09. තවද මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවීම හා සහභාගී වීමම පමණක් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබීම සඳහා සුදුසුකමක් නොවන බව **අවධාරණයෙන්** සඳහන් කරමි.

අත්/කළේ: **එස්.ආලෝකබණ්ඩාර**
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ඉංජි. පී.ඒ.ටී.එන්.පොන්නම්පෙරුම**
ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ

දුරකථන / ෆැක්ස් : 0112 698268
විද්‍යුත් තැපැල් ලිපිනය : d-engs@pubad.gov.lk

SPECIMEN